| මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| දෙවන වාර පරීක්ෂණය - 2018 | | |
| ශිල්ප කලා - II | 11 ශ්‍රේණිය | කාලය පැය දෙකකි |

වැදගත් :

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ද තවත් තෝරාගත් ප්‍රශ්න 4ක් ද, ඇතුළුව මුළු ප්‍රශ්න 5කට පිළිතුරු ලියන්න.

(01) " දේශීය අත්කම් භාණ්ඩ අගයමු" යන තේමාව යටතේ දේශීය කලා කර්මාන්ත ප්‍රදර්ශනයක් ජනකලා කේන්ද්‍රයේ පැවැත්විණි. මේ සඳහා පාරම්පරික නිෂ්පාදන මෙන්ම නව අත්කම් භාණ්ඩද ප්‍රදර්ශනයට තබා තිබුණි.

(1) මෙම වැඩසටහනට ඔබ සහභාගී වූයේ යැයි සිතා එහි දක්නට ලැබුණු දේශීය ශාක භාවිතයෙන් කර තිබූ අත්කම් භාණ්ඩ 04 ක් නම් කරන්න.

(2) ඉහත අත්කම් භාණ්ඩ සෑදීමට යොදාගත් ශාක වර්ග 04 ක් නම් කරන්න.

(3) ප්‍රදර්ශනයට තබා තිබූ පාරම්පරික භාණ්ඩ නැරඹීමට පැමිණි බොහෝ දෙනාගේ අවධානයට යොමුවිය. එවැනි පාරම්පරික භාණ්ඩ 04 ක් ලියන්න.

(4) මැටි භාණ්ඩ මනා නිමාවකින් යුතු වූ නිසා වැඩි ඉල්ලුමක් පැවතුණි. මැටි බඳුන් අලංකාර කිරීමේ ක්‍රම 04 ක් ලියන්න.

(5) ස්වභාවික සහ කෘතිම ආභරණ ජනප්‍රිය කලාවකි. පාසල් තූර්ය වාදක කණ්ඩායමේ සිසුවියන්ට පැළඳීමට සුදුසු ආභරණ කට්ටලයක් අඳින්න.

(6) අපතේ යන ද්‍රව්‍ය භාවිතයෙන් විසිතුරු නිර්මාණ දක්නට ලැබුණි. එවැනි නිර්මාණයකට අවශ්‍ය ද්‍රව්‍ය ලියා සුදුසු රූප සටහනක් අඳින්න.

(7) පන් හා කෙඳි ආශ්‍රිත කාන්තා අත් බෑග් දක්නට ලැබුණි. අත්බෑග් සඳහා විවිධ වියමන් රටා යොදා තිබූ අතර එවැනි වියමන් රටා දෙකක මතුපිට පෙනුම ඇඳ දක්වන්න.

(8) විවිධ සත්ව ආකෘති, බෝනික්කන් වැනි සෙල්ලම් භාණ්ඩ රැඳි කුටිය වෙත කාගෙත් අවධානය යොමුවිය. සිලින්ඩරාකාර බෝනික්කා සෑදීමට අවශ්‍ය මූලික පතරොම අඳින්න.

(9) ප්‍රදර්ශන කුටිවල සිටි අලෙවි සහායිකාවන් ඇඳ සිටි ඔසරිය විවිධ උපාංග යොදා අලංකාර කර තිබුණි. එවැනි ද්‍රව්‍ය 06 ක් ලියන්න.

(10) එම ඔසරිය සඳහා සුදුසු මෝස්තරයක් ඇඳ දක්වන්න. මෙහිදී ඔසරි පලුව හා ඔසරි පොට වෙන වෙනම අඳින්න.

(02) අප අවට පරිසරය නිම වී ඇත්තේ විවිධ ජ්‍යාමිතික හැඩතලවලිනි. ඒවා විවිධ නම්වලින් හැඳින්වීමට හැකිය.

(1) පහත හැඩතල නම් කරන්න.



(i) (ii) (iii)

(2) පාද හතරකින් සමන්විත වූ තල රූප චතුරස්‍ර නමින් හැඳින්වේ. පාද හා කෝණවල අගය අසමාන සම්මුඛ පාද සමාන්තර නොවන චතුරස්‍රය නම් කර රූප සටහන අඳින්න.

(3) පහත හැඩතල ත්‍රිමාණ හැඩතල ලෙස නිර්මාණය කරන්න.




(03) වර්තමානයේ අත්කම් නිර්මාණ ඉතා ජනප්‍රිය මෙන්ම ස්වයං රැකියා ලෙසද කළ හැකිය.

(1) විසිතුරු මැහුම් ක්‍රම 4 ක් නම් කරන්න.

(2) රිබන් එම්බ්‍රොයිඩර් මගින් කිරීමට සුදුසු බිත්ති සැරසිල්ලක රූප සටහනක් අඳින්න.

(3) ළදරු තොප්පිය ගෙතීම පියවර ලෙස විස්තර කරන්න.

(04) වට්ටි, පෙට්ටි, පැදුරු ආදී විවිධ දේ වියවීමේදී රටා යොදා ගනී.

(1) අත් පිස්නා හැදයක් වියවීම සඳහා සුදුසු වියමන් රටා 02 ක් නම් කරන්න.

(2) ඉහතින් ඔබ සඳහන් කළ එක් වියමන් රටාවක මතුපිට මෝස්තරය අඳින්න.

(3) අත් පිස්නා හැදයක් වියවීම සඳහා වැය වූ නූල් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

හැදයේ දිග = 100 cm

හැදයේ පළල = 50 cm

1 cm ට දික් නූල් = 60 යි

දික්නූලේ නොම්මරය = $2/_{30\,s}$ වේ.

මුළු දික් නූල්වල බර සොයන්න.

(05) විවිධ ස්වභාවික හේතුන්ගේ බලපෑමෙන් පාෂාණ දිරාපත් වී මැටි සෑදේ.

(1) පාෂාණ දිරාපත් වීමට බලපාන ස්වභාවික හේතු 04 ක් ලියන්න.

(2) මැටි නිර්මාණය වීමේ ක්‍රියාවලිය අනුව කොටස් 02 කට වර්ග කෙරේ. එම කොටස් 02 නම් කර එයින් නිෂ්පාදනය කරන භාණ්ඩ 02 බැගින් ලියන්න.

(3) මැටි භාණ්ඩ නිෂ්පාදන ක්‍රම 4 ක් නම් කර ඉන් එක් ක්‍රමයක් පියවර ලෙස විස්තර කරන්න.

(06) පදම් කරගනු ලබන මැටි භාවිත කරමින් විවිධ ක්‍රම මගින් නිපදවා ගැනෙන මැටි භාණ්ඩ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි අලංකාර කර ගැනේ.

(1) සකපුවරු වර්ග නම් කරන්න.

(2) සකපුවරුවක මැටි භාණ්ඩයක් ඉදිකිරීමේ අනුපිළිවෙල ලියන්න.

(3) මැටි භාණ්ඩ අලංකරණයේදී භාවිත වන පහත සඳහන් අලංකරණ ක්‍රම අතුරින් 02 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. මැටි දරණු යෙදීම. II. කැටයම් කැපීම. III. මුද්‍රා භාවිතයෙන් මෝස්තර යෙදීම IV. දිස්න යෙදීම.

(07) මල් සැකසුම් භාවිත කළ හැකි අවස්ථා රාශියකි.

(1) මල් සැකසුම් යොදා ගන්නා විශේෂ අවස්ථා 4 ක් ලියන්න.

(2) ස්වභාවික මල් කල් තබා ගැනීමේ ක්‍රම ලියා ස්වභාවික මල් සහ කෘතිම මල් භාවිතයේ ඇති වාසි අවාසි 04 ක් බැගින් ලියන්න.

(3) මනාලියකගේ මල් කළඹකට සුදුසු මල් වර්ග ලියා හැඩ 04 ක් නම්කර ඉන් එක් හැඩයකට මල් කළඹ සාදා ගන්නා ආකාරය පියවර ලෙස විස්තර කරන්න.